**මතුගම ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 02 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති, මතුගම ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ උපුටාගැනීමේදී ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ සහ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂ පිළිවෙලින් රු.35,180 ක් අඩුවෙන්ද රු.35,000 ක් වැඩියෙන්ද වන පරිදි උපුටාගෙන තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාව අනුව ගිණුම්ගත කර නොතිබූ යන්ත්‍ර හා උපකරණවල වටිනාකම වූ රු.22,340 කින් රු.9,750 ක් පමණක් ගිණුම් ගත කර තිබීම නිසා තවදුරටත් ගිණුම් ගත කර නොතිබූ වටිනාකම රු.12,590 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ පුස්තකාල පොත්වල වටිනාකම වූ රු.707,617 ක් පුස්තකාල පොත් ගිණුමට හර කර තිබුණද, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට බැර කර නොතිබුණි. තවද, පුස්තකාල පොත් කපා හැරීම් රු.270 ක්ද එකී ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලෙජරයේ දැක්වුණු රු.28,910,570 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය, ශේෂ පත්‍රයේ රු.28,914,610 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි කඩකුලී ගිණුමේ ශේෂය රු.2,778,239 ක් ලෙස දැක්වෙන අයුරින් ගිණුම රු.4,036,184කට තුලනය කර තිබුණද, හර හා බැර

පැත්තේ එකතුව පිළිවෙලින් රු.6,385,008 ක් හා රු. 3,178,297 ක් වීම නිසා විගණනයේදී නිරීක්ෂණය වූ ශේෂය රු.3,206,711 ක් විය.

(ඊ) හිඟ හිටි කඩකුලී ගිණුමට හර කර තිබූ රු.199,181 ක ශේෂය හඳුනාගත නොහැකි වූ අතර එකී ශේෂයම සමුච්චිත අරමුදල් ගිණුමේ හරටද සටහන් කර තිබුණි.

(උ) ජර්නල් සටහනකින් තොරව වෙළඳ බලපත්‍ර ගිණුමට රු.23,900 ක් හර කර තිබුණි.

(ඌ) ලෙජර් ගිණුම අනුව රු.994,627 ක් වූ නොගෙවූ වැටුප් හා වේතන ගිණුමේ ශේෂය ශේෂ පත්‍රයේ රු.922,872 ක් ලෙස දක්වා තිබුණි.

(එ) ලෙජර් ගිණුම අනුව 2010 දෙසැම්බර් 31 දිනට සේවක ණය රු.9,196,055 ක ශේෂය ශේෂ පත්‍රයේ රු.9,687,386 ක් ලෙස දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.20,369,580 ක් වූ ස්ථාවර තැන්පත් ශේෂය රු.19,651,578 ක් ලෙස බැංකු ශේෂ සනාථ කිරීම්වල දැක්විණ.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ ලැබිය යුතු සේවා ගාස්තු රු.72,600 ක් ගොඩනැගිලි කුලී ගිණුමට බැර කිරීම නිවැරදි කිරීම සඳහා ගොඩනැගිලි කුලී ගිණුමට හර කර හිඟ හිටි ආදායම් ගිණුම බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට තොග ලේඛනය අනුව ඉතිරිව තිබූ තාර බැරල් 35 ක වටිනාකම වූ රු.589,365 ක් අවසාන තොගයට ගෙන නොතිබුණි.

(ක) 2009 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුමකට බැර වී තිබූ රු.520,990 ක ආදායම් හා ස්ථාවර නියෝග මත කර තිබූ රු.75,248 ක් වූ ගෙවීම්, ගිණුම් ගත කර නොතිබුණි.

(ග) වියදම් සාරාංශ අනුව වැඩසටහන් 03 හි ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා සඳහා 2010 දෙසැම්බර් 31 දිනට උපචිත කර තිබූ රු.2,133,282 ක වියදම, ණයහිමි ගිණුමට රු.3,143,282 ක් ලෙස සටහන් කිරීම නිසා රු.1,010,000 කින් ණයහිමි ශේෂය වැඩියෙන් දැක්විණ.

(ච) වියදම් සාරාංශය අනුව ප්‍රාග්ධන වියදම රු.41,096,572 ක්, ආදායම් හා වියදම් ගිණුමට රු.41,788,000 ක් ලෙස ගෙන තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 5 ක් සඳහා උපචිත කර තිබූ වියදම් එකතුව රු.1,890,724 ක් වුවද ඊට අදාලව ණයහිමි ගිණුමට ගෙන තිබූ වියදම් එකතුව රු.2,203,749 ක් විය.

(ට) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ ලීබඩු හා උපකරණවල වටිනාකම රු.188,148 ක් ජර්නල් සටහනකින් තොරව ප්‍රාග්ධනීත කර තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ගිණුම් ශේෂ 6 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.20,214,215 ක් ව අතර ඊට අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු.19,913,966 ක් විය.

(ආ) සාරාංශ ආදායම් ලේඛනයට අනුව වැඩ සටහන් 01 හි වෙනත් ආදායම් රු.1,246,840 ක් ආදායම් හා වියදම් ගිණුමට රු.1,379,060 ක් ලෙස ගෙන තිබීමෙන් රු.132,220 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 <u>ගිණුම් ලේඛන පවත්වාගෙන යාම</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අත්තිකාරම් ලේඛනයේ අත්තිකාරම් ගෙවූ පුද්ගලයින්ගේ නම් සඳහන් නොවූ අතර කාරණය හා මුදල පමණක් සඳහන් වී තිබුණි.

(ආ) ප්‍රධාන ලෙජරයේ ගිණුම් නොසැලකිලිමත් ලෙස එකතු කිරීම නිසා දක්වා තිබූ එකතුන් නිවැරදි නොවූ අතර, ගිණම්වල ඇතැම් සටහන් ටිපෙක්ස් කර නැවත ලියා තිබුණි.

(ඇ) ජර්නල් සටහන්වල ශේෂයන් හා ගිණුම්ගත කර තිබූ ශේෂයන් අතර නොසැසඳීම් ද, ගිණුම් ගැලපීම් කිරීමේදී ජර්නල් සටහන්වලින් තොරව ගිණුම් සටහන් දක්වා තිබූ අවස්ථා ද විය.

1:3:4 **ගෙවිය යුතු ගිණුම්**

--------------------

2010 ඔක්තෝබර් 30 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායකය වූ රු.6,922,295 ක් 2010 දෙසැම්බර් 02 වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

--------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.212,315,896 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති අංක 140 | 2003 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් දක්වා ගෙවා තිබූ රු.6,841,590 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 396(ඇ) | එක් ජංගම බැංකු ගිණුමකට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්මවා ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.202,244 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 හා 572 | 1986 සිට 2006 දක්වා කාලය තුළ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබූ රු.3,487,420 ක තැන්පතු සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.11,872,407 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,233,020 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

----------------

(අ) ආදායම් විෂයයන් 02 ක හා වියදම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර 07% සිට 90% දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක් අනාවරණය වූ අතර ආදායම් විෂයයන් 02 ක හා එක් වියදම් විෂයයක 7% සිට 319% දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය වූයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මංමාවත් අළුත්වැඩියාව හා නඩත්තු වැය විෂය සඳහා (304-4) 2010 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් රු.1,500,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් 2010 නොවැම්බර් 23 වන විට ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා රු.3,490,455 ක් වියදම් කර තිබුණි. එසේ වුවද අතිරික්ත වියදම් ආවරණය කර ගැනීමට රු.6,000,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් සභාගත කර තිබුණේ 2010 නොවැම්බර් 30 දිනය.

## 2.3 ආදායම් පරිපාලනය

-----------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2010** | | | **2009** | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 4,518 | 2,251 | 7,435 | 6,163 | 2,697 | 9,243 |
| (ii) | බදු කුලී | 428 | 1,869 | 3,960 | 5,433 | 3,703 | 4,074 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 225 | 176 | 211 | 267 | 180 | 187 |
| (iv) | වෙනත් ආදායම් | 18,553 | 5,454 | 22,196 | - | -- | -- |

2.3.2 <u>ආදායම් අයකරගැනීම</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) හිඟ ආදායම් අයකරගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය රු.28,910,570 ක් විය.

(ආ) සභාව සතු එළ හරක් මස්කඩය 2009 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියෙන් බදු දී තිබූ අතර බදුකරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. රු.288,832 ක් වූ ආරක්ෂිත ඇප මුදලද තැන්පත් කර නොතිබූ හෙයින් 2009 නොවැම්බර් 30 දිනට හිඟ කුලී රු.100,000 ක් අයකරගත නොහැකි වී තිබුණි. එසේ තිබියදී 2010 වර්ෂයේදීද ඉහත බදුකරුටම එම කඩය නැවත ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියෙන් බදු දී තිබූ අතර එක් මාසයක ආරක්ෂිත ඇප මුදල වූ රු.96,277 ක්ද විගණිත දිනය වූ 2010 නොවැම්බර් වන විටත් හිඟව පැවතුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට අය නොවී පැවත එන විනෝද බදු රු.14,404 ක් ද, වෙළඳ පොල කඩ 62 කින් අයවිය යුතු රු.1,206,567 ක් ද, කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබූ ගොඩනැගිල්ලකින් අයවිය යුතු කුලිය රු.86,000 ක්ද, පෞද්ගලික ආයතනයක අපද්‍රව්‍ය ඉවත්කිරීම වෙනුවෙන් අයවිය යුතු රු.33,550 ක් ද, සභාව සතු බෝට්ටුවක් බදු දීමෙන් 2008 හා 2009 වර්ෂවලට අදාලව අයවිය යුතු රු.27,000 ක් ද වූ හිඟ ශේෂ 2010 නොවැම්බර් වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් විකිණීමේදී පිරිවැටුම මත අයකළ යුතු සියයට 1 ක බදු, ඇස්තමේන්තු විකුණුම් මත අයකර තිබුණි. ඒ ආකාරයෙන් 2004, 2005, 2006 සහ 2008 වර්ෂවලදී එකතුව රු.1,938,229 ක බදු ආදායමක් සභාව විසින් අයකරගෙන තිබුණි.

## 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 39,829 | 36,379 | 3,450 | 37,437 | 32,989 | 4,448 |
| අනෙකුත් | 21,102 | 32,476 | (11,374) | 19,555 | 26,920 | (7,365) |
| උප එකතුව | 60,931 | 68,855 | (7,924) | 56,992 | 59,909 | (2,917) |
| ප්‍රාග්ධන වියදම | 2,150 | 42,463 | (40,313) | 4,025 | 14,841 | (10,816) |
| මුළු එකතුව | 63,081 | 111,318 | (48,237) | 61,017 | 74,750 | (13,733) |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 9,687,386 ක් විය.

### 2:5:2 සමීක්ෂණය නොකළ වත්කම්

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 203 හා 218 රීති ප්‍රකාරව සභාවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි.

2:5:3 **<u>අක්‍රීය ගිණුම්</u>**

වැලිපැන්න හා හොරවල උපකාර්යාල 02 හි රැස්කිරීමේ ගිණුම්වල තැන්පත් කර තිබූ මුදල් ප්‍රධාන ගිණුමට ප්‍රේෂණය නොකිරීම නිසා 2010 දෙසැම්බර් 31 දිනට රු.2,283,882 ක මුදල් ශේෂයක් නිශ්ක්‍රීයව පැවතුණි.

2.5.4 **<u>ඉන්වෙන්ට්‍රි පාලනය</u>**

(i) 2008 පෙබරවාරි 28 දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් විෂයයන් 17 ක් යටතේ ලැබී තිබූ භාණ්ඩ ඒකක 267 සම්බන්ධයෙන් නිකුත් කිරීම් සටහන් කර නොතිබූ අතර 2010 නොවැම්බර් 30 දිනට විෂයයන් 03 ක් යටතේ ඒකක 11 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ii) එකී භාණ්ඩවලට ඇතුළත්ව තිබූ ගෑස් උඳුන් 08 ක් කිසිදු උපයෝජනයකින් තොරව ගබඩාවේ තිබුණි.

(iii) 2010 නොවැම්බර් 30 දින වන විට මිලදී ගෙන තිබූ හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලැබී තිබූ ජල ටැංකිවලින් ලීටර් 1000 ජල ටැංකියක හා ලීටර් 500 ජල ටැංකි 03 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

2.6 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් හා ප්‍රසම්පාදන පරිපාටියෙන් තොරව කුලී පදනම මත වාහන ලබාගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේදී රු.98,340 ක මුදලක් ගෙවා තිබුණි.

2.7 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයෙන් පසු සභාවට පවරාගෙන තිබූ මාර්ග ගැසට් කර ප්‍රකාශයට පත් කර නොතිබුණි.

(ආ) ලංකා බැංකුවේ ජංගම ගිණුමට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුමේ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ ලෙස සඳහන්ව තිබූ 2008

දෙසැම්බර් 10 සහ 2009 අප්‍රේල් 16 දිනැතිව නවුත්තුඩුව ගොවි සංවිධානයට ලියා තිබූ එකතුව රු.16,887 ක් වූ චෙක්පත් 02 ක් අදාල ගොවි සංවිධානය වෙත භාර නොදී විගණිත දිනය වූ 2011 ජුනි මාසය වන විටත් විෂය ලිපිකරු භාරයේ තිබුණි.

(ඇ) මාසික ඉදිරි වැඩසටහන් ඒ ඒ මාසය එළඹීමට පෙර මාසයේ ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් නිලධාරීන් 03 දෙනෙකු විසින් රාජකාරි කිරීමේදී ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර නොතිබූ අතර තවත් නිලධාරීන් 04 දෙනෙකු විසින් රාජකාරි කිරීමේදී ඉදිරි වැඩසටහන්වල වෙනස්කම් සඳහා සංශෝධිත ඉදිරි වැඩසටහන්ද, ඉටුකර තිබූ රාජකාරි අනුව කළ වැඩ වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.244,822 ක් වූ ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

2.8 <u>කොන්ත්‍රාත් පාලනය</u>

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) <u>දියර කිරි අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීම</u>

(i) 2009 වර්ෂයේදී සභා අරමුදල් යොදවාගෙන රු.139,570 ක වියදමකින් දියර කිරි අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ අතර 2010 නොවැම්බර් වන විටත් කිරිහල ආරම්භ කර නොතිබුණි. එසේ වුවද බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් උපකරණවල අයිතිය ඔවුන් සතු වන පරිදි වටිනාකම රු.173,800 ක් වූ උපකරණ 2010 පෙබරවාරි මාසයේදී සභාවට ලබා දී තිබුණි.

(ii) ඉදිකර තිබූ ගොඩනැගිල්ලට අදාල ඇස්තමේන්තුවේ කාර්ය අංක 15 යටතේ දක්වා තිබූ බිත්තිවල ඇතුළත හා පිටත තීන්ත ආලේප කිරීම සඳහා රු.3,219 ක් ගෙවා තිබූ නමුත් එම කාර්යය ඉටුකර නොතිබූ බව 2010 නොවැම්බර් 22 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) <u>බාලිකා පාර පළමු අතුරු පාර කොන්ක්‍රීට් කිරීම (දිග අඩි 400)</u>

(i) රු.280,794 ක වියදමින් 2009 වර්ෂයේදී සෘජු ශ්‍රම පදනම යටතේ කොන්ක්‍රීට් කර තිබූ මාර්ගයේ ආරම්භයේ සිට අඩි 32 අඟල් 08 ක් ඉදිරියෙන් දකුණු පස අඩි 04 අඟල් 07 ක දිගින් හා අඩි 01 අඟල් 09 ක් පළලින් වූ විශාල පැල්මක් තිබූ බව 2010 නොවැම්බර් 29 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) මාර්ගයේ ආරම්භක කොටස දළ බෑවුමක් සහිත සහ දකුණු පැත්තට ඇල වූ ස්වරූපයක් නිරීක්ෂණය වූ නමුත් එම විශේෂ තත්ත්වයට ඔරොත්තු දෙන පරිදි ජලය බැසයෑමට ක්‍රමවේදයක් සකස් නොකර මාර්ගය පමණක් සැලසුම් කර කොන්ක්‍රීට් කර තිබීමෙන් මාර්ගයේ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ඇ) <u>බාලිකා පාර පළමු අතුරුපාර කොන්ක්‍රීට් කිරීම (දිග අඩි 175)</u>

(i) රු.151,267 ක වියදමින් 2010 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර ඇස්තමේන්තුව අනුව මාර්ගයේ කොන්ක්‍රීට් ඝනකම අඟල් 4ක් විය යුතු වුවද මාර්ගයේ අවසානයේ සිට අඩි 05 ක් ඉදිරියෙන් දෙපස කොන්ක්‍රීට් ඝනකම දකුණු පස අඟල් 1.8 ක්ද, වම්පස අඟල් 1.5 ක්ද අවසානයේ සිට අඩි 40 ක් ඉදිරියට දකුණු පස ඝනකම අඟල් 1.5 ක්ද පමණක් විය.

(ii) මාර්ගය ආරම්භයේ සිට අඩි 14 ක් ඉදිරියෙන් වම්පස දිග අඩි 03 යි අඟල් 06 ක හා පළල අඩි 01 යි අඟල් 04 ක කොන්ක්‍රීට් තට්ටුව පැලී ඉරිතලා ගොස් තිබූ බව 2010 නොවැම්බර් 29 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) මාර්ගය දෙපස දිගට පැති ලෑලි ගැසීම වෙනුවෙන් රු.4,255 ක් ගෙවා තිබුණත් සම්පූර්ණ පාරටම පැති ලෑලි ගසා නොතිබුණි.

2.9 **අභ්‍යන්තර විගණනය**

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 5 වන රීතියේ 7 වන උප රීතිය සහ පළාත් පාලන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 19 දිනැති අංක WP/LPD/10/2008 දරන චක්‍රලේඛයේ උපදෙස් පරිදි පවත්වා ගත යුතු අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වාගෙන යෑමට කටයුතු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය